ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026.10.06

එම්.එච්. මුදිත මංජීක මයා,
67C, වුඩ්ලන්ඩ් මාවත,
කළුබෝවිල.

පැමිණිලිකාර පාර්ශවය

එදිරිව

1. පො. සැ (40168) මුණසිංහ,
   පොලිස් ස්ථානය
   මහරගම.

2. පො. කො (95599) පුෂ්පකුමාර,
   පොලිස් ස්ථානය
   මහරගම.

3. ප්‍ර.පො.ප. - ජී.සී.රාජපක්ෂ,
   ස්ථානාධිපති,
   පොලිස් ස්ථානය,
   මහරගම.

වගඋත්තර පාර්ශවය

<u>පැමිණිලි අංකය : HRC/3815/24</u>

පැමිණිල්ල

පැමිණිලිකරු 2024.09.20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, වෘත්තියෙන් තාක්ෂණික සේවා සැපයුම් සමාගමක අධ්‍යක්ෂවරයෙකු වන ඔහු 2024.08.04 වන දින මධ්‍යම රාත්‍රී 12.00ට පමණ සිය යතුරුපැදියෙන් (WP BGC-3232) නිවස බලා යමින් සිටියදී කොට්ටාව, මහල්වරාව පාරේදී මහරගම පොලිස් නිලධාරීන් විසින් නැවැත්වූ බවත්, එහි රාජකාරියේ නිරතව සිටි මුණසිංහ (40168) නැමැති නිලධාරියා පැමිණිලිකරු බීමත්ව සිටින බවට සැක කර, ඔහුගේ යතුරුපැදි යතුර බලහත්කාරයෙන් උදුරාගෙන, පැමිණිලිකරු විසින් ඉල්ලා සිටි වායු බැලූන පරීක්ෂාව (Breathalyzer Test) ලබා දීම ප්‍රතික්ෂේප කර කළ බව සඳහන් කර ඇත.

අනතුරුව, පැමිණිලිකරුව පොලිස් ජීප් රථයට නංවාගෙන මහරගම පොලිසිය වෙත රැගෙන ගොස් ඇති අතර, එම රථය තුළ සිටි වෙනත් සැකකරුවෙකුගෙන් අල්ලස් ලබාගෙන නිදහස් කිරීමට නිලධාරීන් දැරූ උත්සාහයකට පැමිණිලිකරු විරුද්ධ වීම නිසා 01 වන වගඋත්තරකරු ඔහු සමඟ කෝපයට පත්වූ බවයි. පසුව පැමිණිලිකරුව කොළඹ ජාතික රෝහල වෙත වෛද්‍ය පරීක්ෂණ සඳහා රැගෙන ගිය ද, එම කාලය පුරාම ඔහුට ජලය පානය කිරීමට හෝ වැසිකිළි පහසුකම් භාවිතා කිරීමට අවස්ථාව ලබා නොදී පීඩාවට පත් කළ බවත් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එසේම, වෛද්‍යවරිය ලබා දුන් වාර්තාවේ රුධිරයේ මධ්‍යසාර මට්ටම පිළිබඳ කිසිදු අගයක් සටහන්ව නොමැති නමුත්, 01 වන වගඋත්තරකරු විසින් වායු බැලූන පරීක්ෂාවක් (Breathalyzer Test) සිදුනොකර, සිය අභිමතය පරිදි පැමිණිලිකරුගේ රුධිරයේ මධ්‍යසාර මිලිග්‍රෑම් 100කට 0.08ක් අන්තර්ගත බවට අසත්‍ය තොරතුරු ඇතුළත් කර අධිකරණයට කරුණු වාර්තා කළ බවයි. පසුදින උදෑසන දරුවාගේ පාසල් කටයුත්තක් සඳහා යාමට තිබියදීත්, තමා සිරමැදිරිය තුළ රඳවා සිටියදී ඇප ලබා දීමට ඥාතීන් පැමිණ සිටියත්, නිලධාරීන් සිය රාජකාරි මේසය මත හිඳ බුලත් විට සකසමින් සිතාමතා කාලය අපතේ යැවූ බවත්, සිරමැදිරිය තුළදී බලහත්කාරයෙන් ලේඛනවලට අත්සන් ලබා ගත් බවත්, තමා පීඩා විඳින 'සයටිකා' (Sciatica) රෝගී තත්ත්වය පිළිබඳව පැවසුව ද එය නොසලකා හරිමින් රඳවා තබා ගත් බවත්ය. නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවති නඩු විභාගයේදී (T/35798/24), තමා නිවැරදිකරු බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වගන්තිය ප්‍රකාරව තමා නිදොස් කොට මුදාහළ බව පැමිණිලිකරු සඳහන් කර ඇත. මෙම අත්තනෝමතික ක්‍රියාව හේතුවෙන් තමාට සහ තම පවුලේ සාමාජිකයන්ට සිදු වූ අගතිය වෙනුවෙන් සාධාරණය ඉටු කරන ලෙස පැමිණිලිකරු සහනය ලෙස අපේක්ෂා කර ඇත.

02. වගඋත්තරකරුගේ කරුණු දැක්වීම

- **පළමුවන වගඋත්තරකරුගේ ප්‍රකාශය : පොලිස් සැරයන් (40168) එම්.පී.යූ.ආර්. මුණසිංහ.**

2025.07.17 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, 2024.08.04 වන දින මහරගම පොලිස් ස්ථානාධිපතිවරයාගේ නියෝග මත අපරාධ මර්දන සහ ජංගම සංචාරක රාජකාරි සඳහා තමා ඇතුළු කණ්ඩායම පිටත්ව ගිය බවත්, එදින මධ්‍යම රාත්‍රියේ සිට මහල්අරාව හන්දිය අසල ක්ෂණික මාර්ග බාධකයක් යොදා රථවාහන පරීක්ෂාව සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත. එහිදී මුබයෙන් මත්පැන් ගඳ වහනය වූ පැදිකරුවන් තිදෙනෙකු සිය සහයක නිලධාරීන් විසින් තමා වෙත ඉදිරිපත් කළ අතර, සිය සේවා පළපුරුද්ද මත ඔවුන් බීමත්ව සිටින බවට සැක කර අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ බැතලයිසර් නළ හිඟයක් පැවති බැවින් ඔවුන්ව පරීක්ෂා කිරීම සඳහා කොළඹ ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්, එහිදී වෛද්‍යවරිය විසින් අධිකරණ වෛද්‍ය පෝරමයේ "ප්‍රශ්වාසයේ මධ්‍යසාර ගඳ පවතී" යනුවෙන් සටහන් කර තිබූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව සැකකරුවන් පොලිස් ස්ථානය වෙත රැගෙන විත්, ස්ථානාධිපතිවරයාගේ උපදෙස් පරිදි උපසේවය වෙත භාර දී ඇප මත මුදාහැරීමට කටයුතු කළ බවත්, ඔහු කිසිදු අවස්ථාවක පැදිකරුවන්ට පහරදීමක්, බැණ වැදීමක් හෝ අල්ලස් ඉල්ලීමක් සිදු නොකළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

විමර්ශන අවස්ථාවේ දී සිදුකරන ලද ප්‍රශ්න කිරීම් හමුවේ, වගඋත්තරකරු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පොලිස් පෝරම 414 හි ඇති අත්සන තමාගේ බවත්, අධිකරණ වෛද්‍යවරිය ප්‍රශ්වාසයේ මධ්‍යසාර ගඳ පවතින බවට සඳහන් කළ තිබූ බැවින්, වායු බැලූන පරීක්ෂාවකින් (Breathalyzer Test) හෝ රුධිර පරීක්ෂාවකින් තොරව සැකකරුගේ රුධිරයේ මධ්‍යසාර මිලිග්‍රෑම් 100 කට 0.08ක් අන්තර්ගත බවට තමා විසින්ම ලේඛනගත කළ බවත්ය. එසේම, වායු බැලූන පරීක්ෂාවකින් (Breathalyzer Test) තොරව මෙන්ම අධිකරණ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කර නොමැති පසුබිමක එලෙස මධ්‍යසාර අගයන් සටහන් කිරීමට තමාට රාජකාරීමය හෝ නෛතික හැකියාවක් නොමැති බවත් ඔහු සඳහන් කර ඇත. පැමිණිලිකරු පෞද්ගලිකව මුදල් ලබාදීමට විමසූ බවත්, එවිට නියමිත දඩය අධිකරණයට ගෙවන ලෙස දැනුම් දුන් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

- **දෙවන වගඋත්තරකරුගේ ප්‍රකාශය : පොලිස් කොස්තාපල් (95599) එස්.පී.වී. පුෂ්පකුමාර**

2025.06.19 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, පැමිණිල්ලට අදාළ දින මහරගම පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ (CIB) 03 වන ඡේදය යටතේ රාත්‍රී ජංගම සංචාරක රාජකාරි සඳහා පිටත්ව ගිය බවත්, එහිදී තමා පොලිස්

සැරයන් (40168) මුණසිංහ නිලධාරියාගේ සහයක නිලධාරියා වශයෙන් රාජකාරි ඉටු කළ බවත්, එම සංචාරය අතරතුර මාර්ගයේ බීමතින් රිය පදවන ලද පුද්ගලයන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී අදාළ පුද්ගලයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පරීක්ෂා කිරීම සඳහා පොලිස් කණ්ඩායම සතුව බැතලයිසර් (Breathalyzer) නළ නොතිබූ හෙයින්, ඔවුන්ව වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත් බව සඳහන් කර ඇත. එහිදී හෝමාගම සහ කළුබෝවිල යන රෝහල්වල අධිකරණ වෛද්‍යවරුන් රාජකාරියේ නොසිටීම හේතුවෙන්, සැකකරුවන්ව කොළඹ ජාතික රෝහල වෙත රැගෙන ගිය බවත්, ඉන් අනතුරුව නියමිත නෛතික පටිපාටියට අනුව ඔවුන්ව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

03. නිරීක්ෂණ

1. වගඋත්තරකරුවන් විසින් විමර්ශන අවස්ථාවේ දී ලබාදෙන ලද ප්‍රකාශයන් අනුව මෙම සිදුවීම වන අවස්ථාවේ දී පොලිස් කණ්ඩායම සතුව බැතලයිසර් (Breathalyzer) නළ නොතිබූ බව සඳහන් කර ඇති නමුත්, 1979 මත්ද්‍රව්‍ය හා විෂ මත්ද්‍රව්‍ය පනත යටතේ පොලිස් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සහතිකය වන පොලිස් පෝරමයේ (Form 414) පැමිණිලිකරුගේ රුධිරයේ මධ්‍යසාර මට්ටම ලෙස 0.08mg/100ml යන අගය ඇති බවට පළමු වන වගඋත්තරකරු විසින්ම ලේඛනගත කර ඇති බව කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී පිළිගෙන ඇත. අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ ප්‍රාශ්වාසයේ මධ්‍යසාර ගඳ ඇති බව පමණක් සඳහන් කර ඇති පසුබිමක වෛද්‍යවරියා විසින් තහවුරු නොකරන ලද මෙවැනි කාරණයක් පළමු වගඋත්තරකරු විසින් සිය අභිමතය පරිදි සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

තව ද, නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය විසින් "අ.න.වි.ස. 186" (අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වගන්තිය) යටතේ පැමිණිලිකරුව නිදොස් කොට මුදාහැරීම තුළින්, පැමිණිලිකරු බීමත්ව රිය පැදවූ බවට පොලිසිය ඉදිරිපත් කළ චෝදනාව සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට පොලිසිය අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය වේ.

2. සිද්ධිය වූ අවස්ථාවේ පොලිස් රථයේ සිටි අනෙක් සැකකරුවෙකු වන එම්.ඒ. චාමර බුද්ධික විසින් දිවුරුම් ප්‍රකාශයක් මඟින් පැමිණිලිකරු පැමිණිල්ල තුළින් සඳහන් කර ඇති කරුණු තහවුරු කර ඇත.එම දිවුරුම් ප්‍රකාශය මඟින්, රාත්‍රී 11ට පමණ අත්අඩංගුවට ගත් සැකකරුවන් පොලිස් රථය තුළ රඳවාගෙන සිටියදී, වගඋත්තරකාර මුණසිංහ නිලධාරියා විසින් *"මේවා වෙන්න ඕන විදියක් තියෙනවනේ"* යනුවෙන් පවසමින් අල්ලස් ලබාගැනීමට වක්‍රව ඉඟි කළ බවත්, ඊට පැමිණිලිකරු විරෝධය පළ කළ අවස්ථාවේදී නිලධාරියා *"උඹලට උදව්වක් කරන්න ගියාම මේව රෙකෝඩ් කරල ෆේස්බුක් දාන දෙදාහෙන් පස්සේ අපතයෝ දැන් ඉන්නවා"* යනුවෙන් අපහාසාත්මක ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

එසේම, සැකකරුවන් රථය තුළ රඳවා තබාගෙන සිටියදීම නිලධාරීන් ආහාර ගැනීම සහ තේ පානය කිරීම සිදු කළ බවත්, අලුයම 4.30 ට පමණ පමුණුව ප්‍රදේශයේ වෙළඳසැලකින් මුණසිංහ නිලධාරියා සිය පෞද්ගලික අවශ්‍යතාවය සඳහා සපත්තු මිලදී ගත් බවත්ය. එම අවස්ථාවේදී ඔහු රියදුරු වෙත පැමිණ *"සපත්තු දෙක 1500 කට ගත්තේ"* ලෙස පැවසූ බව ද, රෝහලේදී ලබාගත් වෛද්‍ය වාර්තා ලේඛන පුෂ්පකුමාර නිලධාරියා වෙත ලබා දෙමින් මුණසිංහ නිලධාරියා විසින් *"පුෂ්පේ මෙන්න ඔයාගේ දැවැද්ද පරිස්සමින් තියා ගන්න"* යනුවෙන් සරදමක් ලෙස හෝ පෞද්ගලික ජයග්‍රහණයක් ලෙසින් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

තව ද, පැමිණිලිකරු සිය දරුවාගේ පාසල් කටයුත්තක් සඳහා සහභාගී වීමට ඇති අවශ්‍යතාවය පවසා ඔහු මුදාහරින ලෙස බැගෑපත්ව ඉල්ලා සිටියදීත්, නිලධාරීන් සිය රාජකාරි මේසය මත බූලත් විට සකසමින් සිතාමතා කාලය අපතේ යැවූ බවත්, එහිදී මුණසිංහ නිලධාරියා විසින් *"මූන්ව ඇතුලට දාලා*

තියමු නේද පුෂ්පේ" යනුවෙන් පවසා වින්දිතයාව සිරගත කිරීමට කටයුතු කළ බවත්, වින්දිතයන් සිරමැදිරිය තුළ රඳවා සිටියදීම, ඔවුන්ට කියවීමට අවස්ථාව ලබා නොදී ලේඛනවලට බලහත්කාරයෙන් අත්සන් ලබාගත් බවත්ය. එසේම සාක්ෂිකරුගේ ද රුධිර පරීක්ෂණයකින් තොරව රුධිරයේ මධ්‍යසාර මට්ටම පිළිබඳව පොලිසිය ඉදිරිපත් කළ 0.08mg/100ml යන අගය, තමා වරදක් නොකළ ද අධිකරණය හමුවේ වරද පිළිගැනීමට පෙළඹුණේ පොලිසිය විසින් සිදු කරන ලද මෙම රස්තියාදු කිරීම් සහ වෘත්තීයමය වශයෙන් ඇති විය හැකි බාධාවන් මගහරවා ගැනීමේ අරමුණින් බව ද ඔහු සිය දිවුරුම් ප්‍රකාශය මඟින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් පොලිස් ස්ථානයේ ලේඛණයන්ට අදාළ තොරතුරු යතුරු ලියනය කර ඉදිරිපත් කර ඇති නමුත් පැමිණිල්ලට අදාළ සවිස්තරාත්මක වාර්තාව ලබා දීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ . ඒ අනුව ස්ථානාධිපතිවරයා වාර්තා සැපයීම ප්‍රමාද කිරීම තුළින්, සිය යටත් නිලධාරීන්ගේ වැරදි සහ විෂමාචාරයන් ආරක්ෂා කිරීමට ක්‍රියා කර ඇති බව පෙනී යයි.

04. නිගමනය

පැමිණිල්ලට අදාළව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සහ සාක්ෂි අනුව, පළමු වගඋත්තර පොලිස් සැරයන් (40168) මුණසිංහ විසින් අල්ලස් ලබා ගැනීමට දැරූ ප්‍රයත්නයකට පැමිණිලිකරු විරුද්ධ වීම හේතුවෙන් පළිගැනීමේ අභිලාෂයෙන් යුතුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ ප්‍රශ්වාසයේ මධ්‍යසාර ගඳ ඇති බවට පමණක් සටහන්ව ඇති පසුබිමක, කිසිදු ශ්වසන විශ්ලේෂණ පරීක්ෂාවකට (Breathalyzer test) පැමිණිලිකරු භාජනය කිරීමකින් තොරව, 1979 මත්ද්‍රව්‍ය හා විෂ මත්ද්‍රව්‍ය පනත යටතේ පොලිස් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන නිල ලේඛනයක් වන පොලිස් පෝරමයේ (Form 414), පැමිණිලිකරුගේ රුධිරයේ මධ්‍යසාර මට්ටම 0.08mg/100ml අගයක පවතින බවට සටහන් කිරීමට පළමු වගඋත්තරකරු කටයුතු කර ඇත.

මෙලෙස අධිකරණයට කරුණු වාර්තා කිරීම තුළින් පළමු වගඋත්තරකාර පො.සැ.40168 මුණසිංහ විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය ඉදිරියේ සමානත්වයට ඇති අයිතියත්, 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති අත්තනෝමතික ලෙස පැමිණිලිකරු සම්බන්ධව උල්ලංඝනය කර ඇත.රඳවා තබා ගැනීමට සාධාරණ හේතුවක් නොමැති පසුබිමක අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වීමේ අයිතිය ද පැමිණිලිකරු පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව ද උල්ලංඝනය කර ඇති බව ද නිගමනය කරනු ලැබේ.

මෙම ක්‍රියාවලිය සඳහා දෙවන වගඋත්තරකරු පොලිස් කොස්තාපල් (95599) පුෂ්පකුමාර සහාය ක්‍රියාකාරීත්වය මඟින්, පැමිණිලිකරුට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 13(1) සහ 13(2) යන ව්‍යවස්ථාවන් යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට වගකීම දැරිය යුතු බව නිගමනය කරනු ලැබේ.

මීට අමතරව, මහරගම පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපතිවරයා සිය අධීක්ෂණ වගකීම පැහැර හැරීම සහ මෙම සිදුවීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ පැමිණිලිකරුගේ සහතික කර ඇති නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව ලැබීමේ අයිතිය උල්ලංඝනය කර ඇති බවට ද නිගමනය කරනු ලැබේ.

05. නිර්දේශ

01. ව්‍යාජ තොරතුරු ලේඛනගත කිරීම, අධිකරණය වෙත අසත්‍ය කරුණු වාර්තා කිරීම සහ අසත්‍ය සාක්ෂි මත පදනම්ව නඩු පැවරීම සම්බන්ධයෙන්, පොලිස් සැරයන් (40168) මුණසිංහ විසින් රු.10,000.00ක මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් වින්දිත වෙත ගෙවිය යුතුය.

2. අසත්‍ය තොරතුරු ලේඛනගත කිරීමට සහ අධිකරණය වෙත අසත්‍ය කරුණු වාර්තා කිරීමට මෙන්ම අසත්‍ය සාක්ෂි මත නඩු පැවරීමට සහය දැක්වීම වෙනුවෙන්, පොලිස් කොස්තාපල් (95599) පුෂ්පකුමාර විසින් රු.10,000.00 ක මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් වින්දිත වෙත ගෙවිය යුතුය.

3. තොරතුරු ලේඛනගත කිරීම සහ අධිකරණය වෙත අසත්‍ය කරුණු වාර්තා කරමින් අසත්‍ය සාක්ෂි මත නඩු පැවරීම සම්බන්ධයෙන් වගකිවයුතු පොලිස් සැරයන් (40168) මුණසිංහ සහ ඒ සඳහා අනුබල දුන් පොලිස් කොස්තාපල් (95599) පුෂ්පකුමාර යන නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු විනයානුකූල පියවර ගැනීමට පොලිස්පතිවරයා කටයුතු කළ යුතුය.

4. සිය යටත් නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම පැහැර හැරීම සහ අදාළ වාර්තා සැපයීම පැහැර හැරීම පිළිබඳ මහරගම හිටපු පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. - ජී.සී.රාජපක්ෂ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් සුදුසු පියවර ගත යුතුය.

2026. 11 . 12 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු), සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.	නිමල් ජී. පුංචිහේවා, ජ්‍යෙෂ්ඨ නීතිඥ, කොමසාරිස්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) සභාපති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	නිමල් ජී. පුංචිහේවා ජ්‍යෙෂ්ඨ නීතිඥ කොමසාරිස් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත 1. සභාපති
ජාතික පොලිස් කොමිෂන් සභාව - කරුණු දැන ගැනීම සඳහා
කොළඹ 07.

2. පොලිස්පති - නිර්දේශ ප්‍රකාරය සුදුසු පියවර ගැනීම සඳහා
පොලිස් මූලස්ථානය, කොළඹ 02.